# පළමුවන වාර පරීක්ෂණය - 2018
## 13 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව - II කොටස I - I

**කාලය : පැය 2 යි.**

❖ **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

---

(01) බාහිර ලක්ෂණ සලකා කෙරෙන වර්ගීකරණය තුළ කලාව බෙදෙන්නේ,
 (1) ප්‍රාකෘතික කලා, ගැමි කලා, ලලිත කලා
 (2) ජනප්‍රිය කලාව, ව්‍යවහාරික කලාව, ලලිත කලාව
 (3) ප්‍රාකෘතික කලා, ජනප්‍රිය කලා, ව්‍යවහාරික කලා
 (4) ව්‍යවහාරි කලා, ගැමි කලා, ජනප්‍රිය කලාව
 (5) ලලිත කලා, ව්‍යවහාරි කලා, ප්‍රකෘතික කලා ( ....... )

(02) ප්‍රාසාංගික කලාවේ ප්‍රභේද වන්නේ,
 (1) ජිම්නාස්ටික් (ජව සරඹ), සංගීතය, නර්තනය
 (2) සරඹ සන්දර්ශන, බැලේ, මුද්‍රා නාට්‍ය
 (3) සංගීතය, බැලේ, මුද්‍රා නාට්‍යය
 (4) පිහිනුම් සන්දර්ශන, ඔපෙරා, ගීත නාට්‍යය
 (5) මැජික් සන්දර්ශන, වීදි නාට්‍යය, මුද්‍රා නාට්‍යය ( ....... )

(03) චිත්‍රපටයක් හෝ රූපවාහිනී නාට්‍යයක් සජීවී වන්නේ,
 (1) පිටපත ලියන අවස්ථාවේ දී ය.
 (2) කැමරාකරුගේ ඇසට වඩාත් ප්‍රියවන දේ ඔහු විසින් පටිගත කරන අවස්ථාවේ දී ය.
 (3) චිත්‍රපටය හෝ රූපවාහිනී නාට්‍යය ප්‍රේක්ෂකයා නැරඹීමේ දී ය.
 (4) අභිවාහකයකු මගින් සජීවී ව ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීමේ දී ය.
 (5) චිත්‍රපට, ටෙලිනාට්‍ය, කාටූන් යන කලා ද කැමරා ඇසින් දකින දේ, අජීව ප්‍රේක්ෂකයා වෙතට ප්‍රක්ෂේපණය කිරීමේ දී ය. ( ....... )

(04) නළු නිළියන් විසින් සජීවී ව වේදිකාව මත එම මොහොතේ ම මවා පෙන්වන්නා වූ කලාව වන්නේ,
 (1) සිනමා පටයක දී ය. (2) මුද්‍රා නාට්‍යයක දී ය.
 (3) නාට්‍ය කලාවේ දී ය. (4) නර්තන කලාවේ දී ය.
 (5) ඔපෙරාවේ දී ය. ( ....... )

(05) ''(නර්තකීය) මුවින් ගීතය ගයන්නී ය, හස්තයෙන් අර්ථය ප්‍රකට කරන්නී ය, දෑසින් භාවය දක්වන්නී ය, දෙපයින් තාලය තබන්නී ය'' මෙයින් ප්‍රකාශ වන්නේ,
 (1) නාට්‍ය ගැන ය. (2) නෘත්ත ගැන ය.
 (3) භරත නාට්‍ය ගැන ය. (4) ඔපෙරා ගැන ය.
 (5) නෘත්‍ය ගැන ය. ( ....... )

(06) ''නාට්‍යය ජීවිතයේ පිටපතකි. සිරිත් විරිත්වල කැටපතෙකි'' යන ප්‍රකාශය කරන ලද්දේ,
 (1) බර්නාඩ් ෂෝ ය. (2) ධනංජය ය. (3) භරතමුනි ය.
 (4) ඇලඩයිස් නිකොල් ය. (5) ඇරිස්ටෝටල් ය. ( ....... )

(07) ආශිර්වද කිරීම, දුනුදිය ඇදීම, අහසින් යාම, අසුන් ගැනීම වැනි වේදිකාවේ සිට ගන්නා ක්‍රම හෙවත් ඉරියව් හඳුන්වන්නේ,

(1) ''චරී'' යනුවෙනි. (2) ''ස්ථානක'' යනුවෙනි.

(3) ''හස්ත'' යනුවෙනි. (4) ''කරණ'' යනුවෙනි.

(5) ''මුද්‍රා'' යනුවෙනි. (......)

(08) සංස්කෘත නාට්‍යයේ එන විදූෂක අතේ ගෙන යන ''දණ්ඩ කෂ්ඨය'' යනුවෙන් හඳුන්වන්නේ,

(1) ලී දණ්ඩකි. (2) වකුටු සැරයටිය

(3) විෂ සහිත කෝට්ටකි. (4) මැජික් බලයක් ඇති දණ්ඩකි.

(5) වේලිච්ච දණ්ඩකි. (......)

(09) ''නූතන නාට්‍ය ප්‍රවණතා'' ලෙස සැලකෙන්නේ,

(1) ආඛ්‍යාන (Epic), දිළිඳු රංගය, විකාරරූපී රංගය

(2) ට්‍රැජඩි, කොමඩි, සැටර්, ප්‍රහසන

(3) දිළිඳු රංගය, කුරිරු රංගය, සංවාද මණ්ඩප නාට්‍යය

(4) කොමඩි, ආඛ්‍යාන, බ්ලැක් බොක්ස්

(5) සැටර්, ආඛ්‍යාන (Epic), දිළිඳු රංගය, විකාරරූපී රංගය (......)

(10) රෝම රඟමඩල තුළ ප්‍රේක්ෂක මණ්ඩපය හඳුන්වන්නේ,

(1) පැජන්ට් වැගොන් (Pageant Vagon) (2) කේවියා (Cavea)

(3) ස්කීනියා ෆ්‍රොන්ස් (Scaenae Frons) (4) ප්‍රේක්ෂාලය (Theatron)

(5) මණ්ඩප වේදිකාව (Plattorm Stage) (......)

(11) වේදිකාවේ දී දෘශ්‍ය රූපය ප්‍රබල කිරීමට හේතු වන්නේ,

(1) වර්ණ සංයෝජනයන්, රංගාලෝකය සමග මනාව සම්මිශ්‍රණය වී නොතිබීම.

(2) පසුතල නිර්මාණය හා අංග රචනාව ප්‍රබල වීමෙනි.

(3) නාට්‍යයේ ශෛලිය අනුව ඇඳුම් නිර්මාණය වීමෙනි.

(4) නාට්‍යයේ අවස්ථා, සිදුවන වකවානුව අනුව රංග භාණ්ඩ නිර්මාණය වීමෙනි.

(5) නාට්‍යෝපකරණ නාට්‍යයේ ශෛලිය අනුව නිර්මාණය වීමෙනි. (......)

(12) වේෂ නිරූපණ ශිල්පියාගේ කාර්යය සම්බන්ධයෙන් වඩාත්ම නිවැරදි පිළිතුර වන්නේ, මේ සංවාදය අයත් නාට්‍ය ප්‍රභේදය කුමක් ද?

(1) පවතින රූපය වඩාත් ඉස්මතු කිරීමෙනි.

(2) ආලෝකයට උචිත වන අන්දමට සකස් කිරීමෙනි.

(3) රංගාලෝකයේ වර්ණ සංයෝජනයට උචිත වන අන්දමට අංග රචනය කළ යුතුය.

(4) චරිතයේ ලක්ෂණ ඉස්මතු කරමින් නාට්‍යයේ භූමිකාවට අදාළ වන අයුරින් වෙස් ගැන්වීම.

(5) අංග රචනය චරිතයට අනුව සරල විය යුතුයි. (......)

(13) නාට්‍ය කලාවට සම්බන්ධ ප්‍රේක්ෂාව (Spectacle) පිළිබඳ පැරණි හා නවීන අර්ථ කිහිපයක් ඇත. නාට්‍ය කලාවට සම්බන්ධව මෙම සංකල්පය ඇරිස්ටෝටල් විසින් පෙන්වා දෙනු ලැබ ඇත්තේ,

(1) ප්‍රේක්ෂාව යනුවෙනි. (2) රසඥතාව යනුවෙනි.

(3) දෘෂ්ටි ගෝචර භාවය යනුවෙනි. (4) කුශලතාව යනුවෙනි.

(5) පරිකල්පනය යනුවෙනි. (......)

(14) නාට්‍යයක ගුණාත්මක බව තක්සේරු කිරීමට හේතුවන නිර්ණායකයකි.
(1) ප්‍රේක්ෂාව (2) දෘශ්‍ය රූපය
(3) සමාජයට ලබා දෙන පණිවුඩය (4) ප්‍රේක්ෂක ප්‍රතිචාර
(5) අධ්‍යක්ෂකගේ සමාජ, සංස්කෘතික, දේශපාලන මතවාදී නිර්මාණාත්මක චින්තනය (......)

(15) රංග වින්‍යාසය මුලින්ම පෙළ ගැස්වෙන්නේ,
(1) අධ්‍යක්ෂකගේ වේදිකා හැසිරවීම හා නාට්‍යයේ ශෛලියට අනුව අධ්‍යක්ෂකගේ නිර්මාණාත්මක චින්තනයේ ය.
(2) නාට්‍ය පෙළට හා එහි ශෛලියට අනුව නර්තන වින්‍යාසකරුවාගේ නිර්මාණාත්මක භාවිතාවේ ය.
(3) නාට්‍ය පෙළට හා එහි ශෛලියට අනුව නාට්‍ය රචකයාගේ නිර්මාණාත්මක චින්තනයේ ය.
(4) වේදිකා පරිපාලකගේ නාට්‍ය ශෛලියට අනුව සිතෙහි මැවෙන නිර්මාණාත්මක චින්තනයේ ය.
(5) ප්‍රේක්ෂකයාගේ සිතෙහි මැවෙන නිර්මාණාත්මක චින්තනයෙහි ය. (......)

(16) නාට්‍යයක් වේදිකාගත වන අවස්ථාවේදී වඩාත්ම වගකීම් දරන්නේ,
(1) නාට්‍ය රචකයා (2) නාට්‍ය අධ්‍යක්ෂක
(3) නාට්‍යයේ අර්ථපති (4) වේදිකා පරිපාලක
(5) ආලෝකකරණ ශිල්පියා (......)

(17) සංස්කෘත නාට්‍යයක ප්‍රකාශ භාෂණය යනුවෙන් හඳුන්වන්නේ,
(1) සාමාන්‍ය කතාව හා ප්‍රේක්ෂකයා ආමන්ත්‍රණය කිරීම.
(2) රිද්මයානුකූල කතාව හා ආකාශ භාෂණය
(3) ප්‍රේක්ෂකයාට පමණක් ඇසෙන ප්‍රකාශනය
(4) තමන්ගේ ප්‍රකාශනය අනෙක් නළුවන්ට නෑසෙතැයි ප්‍රේක්ෂකයා විශ්වාස කිරීම.
(5) කක්ෂ්‍යා භාවිතාවේ දී ඇතිවන ස්වභාවික කතාවයි. (......)

(18) වටයක් යාමෙන් ස්ථාන මාරුවක් සිදුවීම ද, ආත්ම භාෂණය ද වඩාත් උචිත අන්දමින් භාවිතා කිරීම තුළ ප්‍රේක්ෂාවෙන් වඩාත් තියුණු අන්දමින් උද්දීපනය හා විශ්වාසනීයත්වය ඔප් නැංවූයේ,
(1) සංස්කෘත නාට්‍යයේ ප්‍රේක්ෂකයා තුළ ය.
(2) ග්‍රීක නාට්‍යයේ ප්‍රේක්ෂකයා තුළ ය.
(3) මධ්‍යකාලීන ප්‍රේක්ෂකයා තුළ ය.
(4) රෝම ප්‍රේක්ෂකයා තුළ ය.
(5) යථාර්ථවාදී ප්‍රේක්ෂකයා තුළ ය. (......)

(19) සැපදුක දනවන ක්‍රියා ආත්මකොට ඇත්තා වූ ලෝක ස්වභාවය අංගිකාදී අභිනයෙන් ඉදිරිපත් කරනු ලබන්නේ,
(1) ලෝක ධර්මී ලක්ෂණයකි. (2) නාට්‍ය ධර්මී ලක්ෂණයකි.
(3) අසම්මත නාට්‍ය ලක්ෂණයකි. (4) මිශ්‍ර ශෛලියේ ලක්ෂණයකි.
(5) එපික් නාට්‍යයේ ලක්ෂණයකි. (......)

(20) කාව්‍ය ශාස්ත්‍රයේ පරිච්ඡේද ගණන,
(1) 26 කි. (2) 24 කි. (3) 19 කි. (4) 22 කි. (5) 32 කි. (......)

(21) කවියකු සතුව අනුකරණ මාධ්‍ය විධි ගැන කාව්‍ය ශාස්ත්‍රයේ කුමන පරිච්ඡේදවලින් කියවේද?
(1) 2, 3, 4 පරිච්ඡේදවලනි. (2) 1, 3, 4 පරිච්ඡේදවලිනි.
(3) 3, 4, 5 පරිච්ඡේදවලිනි. (4) 4, 5, 6 පරිච්ඡේදවලිනි.
(5) 3, 2, 1 පරිච්ඡේදවලිනි. (......)

(22) ග්‍රීක ශෝකෝත්පාදයේදී අනුකරණය කෙරෙන පුද්ගලයන් ගේ ස්වභාවය වන්නේ,
(1) හොඳ පුද්ගලයන් ය.
(2) අසාමාන්‍ය පුද්ගලයන් ය.
(3) ප්‍රකෘති තත්ත්වයට වඩා හොඳ පුද්ගලයන් ය.
(4) ඉතා හොඳ ගතිගුණ ඇති වීරයන් ය.
(5) ප්‍රඥාවන්ත මිනිසුන් ය. (......)

(23) ''භාව වූ කලි යම් ආකාරයක හෝමියෝපති රෝග නිවාරණ මාර්ගයක් වෙයි'' යනුවෙන් පවසන ලද්දේ,
(1) ඇරිස්ටෝටල් පඬිවරයා ය. (2) ප්ලෝටෝ විසිනි.
(3) බුචර් නම් විචාරකයා විසිනි. (4) ඇලඩයිස් නිකොල් විසිනි.
(5) සොෆක්ලිස් විසිනි. (......)

(24) "hamartia" යනුවෙන් හඳුන්වන්නේ,
(1) ''භාග්‍ය සම්පන්න සහ නිර්දෝෂ විය යුතු නොවේ'' යන්නයි.
(2) ඔහු යහපත් සහ උත්තම ගති ඇත්තකු වුවත් ඔහු තුළ ඇතැම් මානව දුර්වලකම් සහ අඩුපාඩු නොතිබිය යුතු බවයි.
(3) ඛේදනීය වීරයා රජකු හා ප්‍රභූවරයෙකු විය යුතු බවයි.
(4) ඔහු සෞභාග්‍යත්, සමෘද්ධිමත්, උසස් පෙළපතකට අයත් වූවකු විය යුතු බවයි.
(5) ඔහු අභාග්‍යයට මුහුණ දෙන්නේ ඔහුගේ දුෂ්චරිත සහ දුෂ්ටකම් නිසා නොව චරිතයේ දක්නට ලැබෙන ප්‍රමාද දෝෂයක් (......)

(25) ''සුරංගීට දුක හිතුණා'' යන ගීතයේ රචක, ගායනය කවුරුන්ද?
(1) මහගමසේකර, ඩබ්.ඩී. අමරදේව
(2) සුනිල් ආරියරත්න, නන්දා මාලිනී
(3) සුනිල් ආරියරත්න, දීපිකා ප්‍රියදර්ශනී පීරිස්
(4) ප්‍රේමකීර්ති ද අල්විස්, නන්දා මාලිනී
(5) මහගමසේකර, නන්දා මාලිනී (......)

(26) රංගයට සම්බන්ධ වන නළු නිළියන් ඒකව ගොඩනගන ලද රූපයෙන් මනා ප්‍රේක්ෂාවක් (Spectacle) මැවෙන අතර, මෙහිදී වාචික අභිනය භාවිතා නොකරන අතර මෙම රූප හඳුන්වන්නේ,
(1) ස්ථිර චල රූප යනුවෙනි. (2) ස්ථිර අචල රූප යනුවෙනි. (Freez)
(3) රංග වින්‍යාසය යනුවෙනි. (4) ප්‍රේක්ෂාව යනුවෙනි.
(5) අස්ථිර අචල රූප යනුවෙනි. (......)

(27) ඔරෙස්ටියා නාට්‍ය ත්‍රිකයට අයත් නාට්‍ය වන්නේ,
(1) ඇගමෙම්නොන්, ඇජැක්ස්, ඉයුමෙනිඩ්ස්
(2) ඉයුමෙනිඩ්ස්, කෝයිපොරොයි, විමන් ඔෆ් ට්‍රකීස්
(3) ඇගමෙම්නොන්, ෆිලොක්ටිටිස්, කෝයිපොරොයි
(4) ඇගමෙම්නොන්, කොයිපොරොයි, ඉයුමෙනිඩ්ස්
(5) ඇන්ටිගනි, ඇජැක්ස්, විමන් ඔෆ් ට්‍රකිස් (......)

(28) මීඩියා, ද ට්‍රෝජන් විමෙන්, හිපොලිටස යන නාට්‍ය ත්‍රිත්වයේ හිමිකරු වන්නේ,
(1) ඊසිකිලස් (2) සොෆොක්ලීස් (3) යූරීපිඩීස්
(4) ඇරිස්ටොෆනිස් (5) තෙස්පිස් (......)

(29) දූව පාස්කු සංදර්ශනයේ පාස්කු ශිල්පීන් තම භූමිකා ඉදිරිපත් කරනු ලබන්නේ,

(1) අතිශයෝක්ති ශෛලිගත ස්වභාවයෙනි.
(2) ලෝකධර්මී ආකාරයට භාවාතිශය අයුරිනි. (Melodramatic Form)
(3) නාට්‍ය ධර්මී ශෛලියෙනි.
(4) ලෝකධර්මී ශෛලියෙනි.
(5) මිශ්‍ර ශෛලියෙනි. (.......)

(30) ප්‍රේක්ෂක ප්‍රතිචාර මගින් නාට්‍යකරුවෙකුට ලැබිය නොහැකි ප්‍රතිලාභයක් වන්නේ,

(1) අපූර්වත්වයෙන් අනූන නිර්මාණ බිහි කිරීමේ ශක්තිය වර්ධනය වීම.
(2) නාට්‍ය කලාව ඉහළ තලයකට නැංවීමට ශක්තිය ඇති වීම.
(3) නාට්‍ය කලාව සාමූහික කලාවක් බැවින් ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ආනුශාංගික ශිල්පීන්ගේ දායකත්වය ලබා ගැනීම සම්බන්ධයෙන් විවිධ මතවාද ඇතිවීම සහ ඔවුන්ව නාට්‍යයෙන් ඉවත් කිරීම.
(4) උසස් කලාත්මක ප්‍රසාංගික අත්දැකීම් ප්‍රේක්ෂකයා වෙත ප්‍රදානය කිරීමට හැකියාව ලැබීම.
(5) යුගයේ අවශ්‍යතා හඳුනාගෙන නිර්මාණකරණයේ යෙදීම. (.......)

(31) ප්‍රබල විචාර කලාවක් බිහිකිරීම උදෙසා විචාරකයකු නිරන්තරයෙන්ම වර්ධනය කරගත යුතු ගුණාංගයක් නොවන්නේ,

(1) නිර්මාණ රස වින්දනයේ යාවත්කාලීනයකු විය යුතුය.
(2) විවිධ ශෛලියේ නාට්‍ය රස විඳින්නෙකු විය යුතුය.
(3) විවිධ විචාර සිද්ධාන්ත අධ්‍යයනය කරන අයකු විය යුතුය.
(4) බොහෝ ඇසූපිරූ ඇත්තෙකු විය යුතුය.
(5) විචාරකයා තුළ ඒකපාර්ශ්වීය දෘෂ්ටියක් තිබිය යුතුය. (.......)

(32) ''සෝර නාද කර, බියට පත් කර මහද සියුමැලි කවුද ආවේ'' ප්‍රකාශයෙන් කියවෙන්නේ,

(1) දේව නීතිය අභිබවායන රාජ නීතිය මගින් උල්ලංඝනය වන කාන්තා අයිතිවාසිකම්, සමාජය හමුවේ ගැහැනිය සදාතනවම අසාධාරණයට ලක්වන බව.
(2) ජගත් මාතා සංකල්පය සමඟ මාතෘත්ව සංකල්පය හා එය කුවේණිගෙන් වියැකී යන අන්දම
(3) කුවේණිය යනු අශිෂ්ට සම්මත හෙළ රැජිනක බව
(4) මස් බුදින යකිනියක වන දයාර්ද්‍ර විරහිත මවක බව
(5) ඇය සසර සැරිසරමින් අහිමි වූ ආදරය නොපතන බව (.......)

(33) ඊඩිපස් රජුගේ චරිතය නාට්‍ය පුරා විකාශනය කර ඇත්තේ,

(1) බියගුළු මිනිසකු ලෙසිනි.
(2) පරමාදර්ශී රජෙකු ලෙසනි.
(3) වීර රජෙකු ලෙසිනි.
(4) අවංක පුද්ගලයෙකු ලෙසිනි.
(5) රාජද්‍රෝහියෙකු ලෙසිනි. (.......)

(34) සොෆොක්ලීස්ගේ මූලික අධ්‍යාසය වනුයේ,

(1) ''ඊඩිපස්'' නම් පුරුෂයා තමාගේ ජීවිතය පිළිබඳව කරන ගවේෂණයක ප්‍රතිවිපාක වශයෙන්, තමා නොදත් දෛවෝපගත ප්‍රහාරයකට ලක්වී ඇදවැටීම ගෙන හැර දැක්වීම ය.
(2) පීතෘ ඝාතනයත්, මව සමඟ අඹු සැමියන් සේ හැසිරීමත් යන බරපතළ පාපකර්ම ඊඩිපස් අතින් සිදු වූ නිසා ඔහුව වැරදිකරුවකු බවට පත්කිරීමට ය.
(3) මිහිපිට දැරිය නොහැකි වැරදිකාර චරිතයක් තුළින් මිනිසත්භාවය පිළිබඳ ගැඹුරු අර්ථයක් නිරූපණය කිරීමට උත්සාහ නොකිරීමයි.
(4) හොඳ මිනිසත්භාවය නිසාම, තමා නොදැන කළ වැරදි පිළිබඳව ලිහිල්භාවයකින් සිතා මතාම ක්‍රියා කිරීමයි.
(5) ඉරණම මිනිසාගේ දෛවයට හරස් වන අයුරු දැක්වීමට උත්සාහ කිරීමය. (.......)

(35) විකට රසයෙන් පිරිපුන් නුවර යුගයට අයත් ''සාක්කියක්'' නම් පද්‍ය පන්තියේ කවියා කවුද?

(1) ගජමන් නෝනා (2) රැයිපියල් තෙන්නකෝන් (3) අඹන්වෙල රාල

(4) ඇලපාත මුදලි (5) සිරි ගුණසිංහ (......)

(36) ''කලුක් සපුත් සවුත් දරිත්

ලමිත් කුමිත් බවුත් තරිත්

කිරිත් ගිරිත් සුවත් තරින්

ඇවිත් කළ රොසේ වහොයියා

අවුල් නාද සපිරිවර්දනේ

දින දින අවුල් නාද සපිරිවර්දනේ

මෙම කවියෙන් කියැවෙන චරිත ගැමි කාන්තාවන් මෙන් සැරසී කෝලාහලයකට සූදානම්ව වේදිකාවට පැමිණ ආංගික අභිනයෙන් දබරයක ස්වරූපයට රූපණය කරයි. එම චරිත මොනවාදැයි ලියා දක්වන්න.

..............................................................................................................................................................

..............................................................................................................................................................

(37) වේදිකා පසුතල ද්‍රව්‍යමය වශයෙන් සකස් කිරීමේ දී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් සඳහන් කරන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

(38) නාට්‍ය සංගීතය බෙදිය හැකි කොටස් තුන මොනවාද?

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

(iii) ..............................................................................................................................

(39) විවිධ වර්ණ මගින් විවිධ අර්ථකථන හා අර්ථවර්යා ලක්‍ෂණ හෝ මනෝභාව සංකේතවත් කෙරේ. ඒ අනුව දුඹුරු හා දම්වලින් කියවෙන්නේ කුමක් ද?

..............................................................................................................................................................

(40) වේදිකා නාට්‍ය අංග රචනයේදී භාවිතා කළ යුතු මුඛ්‍ය මූලධර්මයනය් කුමක් ද?

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

# පළමුවන වාර පරීක්ෂණය - 2018
# 13 ශ්‍රේණිය
# නාට්‍ය හා රංග කලාව - II කොටස

## A කොටස

(01) (i) ප්‍රාසාංගික කලාව හඳුන්වන්න.

(ii) ප්‍රාසාංගික කලා දෙකක් විමසන්න.

(iii) නාට්‍ය පෙළ ප්‍රාසාංගික ඉදිරිපත් කරන්නේ කෙසේදැයි විග්‍රහ කරන්න.

(02) (i) නාට්‍ය සම්බන්ධ නිර්වචන හතරක් ලියන්න.

(ii) නළුනිළියන් හා ප්‍රේක්ෂකයා අතර ඇතිවන සෞන්දර්යාත්මක භාවමය හැඟීම පිළිබඳව විමසීමක් කරන්න.

(iii) ''නාට්‍ය හා රංග කලාව'' යන දෙපද පිළිබඳ විග්‍රහ කරන්න.

(03) නාට්‍යයේ පෙළ රචකයා වන හෙන්රි ජයසේන විසින් සිය පෙරවදනේ සඳහන් කරනු ලැබ ඇති ''කුවේණිය මා දකින්නේ මෙලොව සදාතන ගැහැනිය ලෙසය'' යන පාඨයේ ගැබ්ව ඇති අර්ථය විග්‍රහ කරන්න.

## B කොටස

(01) (i) නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? (ල. 4)

(ii) නාට්‍ය ධර්මී රංග ශෛලිය සතර අභිනයෙන් ප්‍රකට වන අයුරු පැහැදිලි කරන්න. (ල. 5)

(iii) ඕනෑම නාට්‍යයක නාට්‍ය ධර්මී ලක්ෂණ දැකිය හැකිය. විමසන්න. (ල. 6)

(02) (i) කලාව බාහිර ලක්ෂණ සලකා කෙරෙන වර්ගීකරණය හඳුන්වන්න. (ල. 4)

(ii) කලාව ගුණාත්මක අංශය සලකා කෙරෙන වර්ගීකරණය උදාහරණ සහිතව විමසන්න. (ල. 5)

(iii) ප්‍රාසාංගික කලා අතර පුළුල් වූ නිරූපණ කලාව වේදිකා නාට්‍ය කලාව වේ. විමසන්න. (ල. 6)

(03) සාහිත්‍ය උත්සවය, කලා උළෙල, වාණිජ දිනය, ළමා දිනය යන මාතෘකාවෙන් එකක් තෝරාගෙන නාට්‍යෝචිත අවස්ථා ප්‍රතිනිර්මාණය කර රංග විධාන යොදමින් සුදුසු මාතෘකාවක් සහිත කෙටි නාට්‍ය පිටපතක් ලියන්න.